# දහම් පාසල් අවසාන විභාගය

## බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

### 06 වන පාඩම ; සමථ විපස්සනා භාවනා

[[ 2024/2025 ]] 05 වන ප්‍රශ්නය

I සමථ භාවනාව සඳහා යෙදෙන අපර නම් දෙකක් ලියන්න.
II සමථ භාවනාවෙන් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ කෙටියෙන් පැහැදිලි කරන්න.
III අ) ත්‍රිලක්ෂණය හා විදර්ශනා භාවනාව අතර ඇති සම්බන්ධය අනාවරණය කරන්න.
ආ) කර්මස්ථාන ලබා ගැනීමේදී සැළකිළිමත් විය යුතු චරිත විභාගය හෙළි කරන්න.
IV බෞද්ධ භාවනාව සාර්ථක ජීවිතයකට ඉවහල් වන ආකාරය ඔබ කැමති කර්මස්ථාන දෙකක් ඇසුරෙන් ප්‍රකට කරන්න.

[[ 2020/2021/2022/2023 ]] 05 වන ප්‍රශ්නය

I ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ එන සම්මා සති,සම්මා සමාධි යන අංග දෙකට උපයෝගීවන භාවනාව නම් කරන්න.
II අ) ඉහත 1හි සඳහන් භාවනාව හඳුන්වන සමානවාචී පද දෙකක් ලියන්න.
ආ) ඉහත 1හි සඳහන් භාවනාව වැඩීමෙන් ලද හැකි ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.
III අ) ඉහත 1හි සඳහන් භාවනාවට අයත් කර්මස්ථන සංඛ්‍යාව කොපමණ දැයි දක්වන්න.
ආ) ඉහත 3හි (අ) හි දැක්වූ කර්මස්ථන නම් වශයෙන් සඳහන් කරන්න.
IV මානසික නිරෝගී සුවතාව ආරක්ෂා කර ගැනීමට භාවනාව මාර්ගයක් වශයෙන් ගත හැකිය. හේතු දක්වමින් මෙම කියමන සනාථ කරන්න.

[[ 2019/2020 ]] 05 වන ප්‍රශ්නය

I "භාවේති වඩ්ඪේති ඒතායාති භාවනා" මේ පාලි පාඨයට අනුව භාවනාව යනු කුමක්දැයි හඳුන්වා දෙන්න.
II සමථ භාවනාවෙන් ලද හැකි පංච අභිඥා හෝ අෂ්ඨ සමාපත්ති හෝ නම් වශයෙන් දක්වන්න.
III මානසික සංවරයෙන් යුත් විනය ගරුක ශිෂ්‍ය ජීවිතයක් උදෙසා භාවනාව උපයෝගී කරගත හැකි ආකාරය පහදා දෙන්න.

## [[ 2017/2018 ]] 06 වන ප්‍රශ්නය

I ධ්‍යාන සමාපත්ති හා ප්‍රඥා සමාපත්ති ප්‍රතිලාභයට හේතුවන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

II එම භාවනා ක්‍රමවලින් ලෝකය පිළිබඳව යථාර්ථය දැකිය හැකි භාවනාව කවරේදැයි දක්වා, එය හඳුන්වා දෙන්න.

III අරූපාවචර සමාපත්ති නම් වශයෙන් දක්වා, එමඟින් කෙළෙස් සමථය කළ භාරතීය ඍෂිවරුන් දෙදෙනෙක් නම් කරන්න.

IV “අසංවර මනසක් සංවර මනසක් බවට පත්කරගන්නා ක්‍රම මාර්ගය භාවනාවයි.” මෙම ප්‍රකාශය පහදා දෙන්න.

## [[ 2016/2017 ]] 05 වන ප්‍රශ්නය

I සමථ භාවනාව උපයෝගී කරගන්නා ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් අංග දෙක නම් කරන්න.

II සමථ භාවනාවට අයත් කර්මස්ථාන සංඛ්‍යාව ලියා, සම්බෝධි ඥාණය සඳහා බෝසතාණන් වහන්සේ ක්‍රියාත්මක කළ භාවනාව කුමක්දැයි ලියා දක්වන්න.

III සමථ භාවනා මාර්ගයෙන් ලද හැකි උසස් ප්‍රතිඵලයක්වූ පංච අභිඥා ලියා දක්වන්න.

IV “හිත හික්මවා ගැනීමට පමනක් නොව මානසික ඒකාග්‍රතාව හා චිත්ත පාරිශුද්ධියට ද භාවනාවෙන් ලැබෙන්නේ මහත් අනුබලයකි.” මේ සඳහා කරුණු ගෙනහැර දක්වන්න.

## [[ 2015/2016 ]] 05 වන ප්‍රශ්නය

I චිත්ත සමාධිය හා ප්‍රඥාව ඇති කරගන්නා භාවනාවන් නම් කරන්න.

II එම භාවනාව කෙටියෙන් හඳුන්වන්න.

III කර්මස්ථාන යනු කවරේදැයි හඳුන්වා ආනාපානසතිය කර්මස්ථානයක් වන්නේ කවර හෙයින්දැයි දක්වන්න.

IV ඔබ කැමති භාවනාවක් මඟින් නොසන්සුන් මනසක් සන්සුන් කරගන්නා ආකාරය පහදා දෙන්න.

## [[ 2014/2015 ]] 05 වන ප්‍රශ්නය

I බුදු දහමෙහි භාවනා යන පදය හඳුන්වා දී ඇති ආකාරය පැහැදිලි කරන්න.

II සමථ භාවනාවට අයත් චතු බ්‍රහ්ම විහාර නම් කරන්න.

III සමථ භාවනාවෙන් යටපත් කරන නීවරණ ධර්ම පාලියෙන් දක්වා, මේවායින් ක්‍රෝධය, වෛරය සඳහා අදාළවන නීවරණය දක්වන්න.

IV සමථ භාවනාවෙන් ලබා ගත හැකි ඉහළම ප්‍රතිඵලය පෙන්වාදී, නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කර ගැනීම නිසා මානසික නිරෝගීතාව සලසා ගත හැකි අයුරු පහදා දෙන්න.

## [[ 2013/2014 ]] 05 වන ප්‍රශ්නය

I සිත එකඟ කිරීම සඳහා අශ්වාස ප්‍රශ්වාස දෙක යෝග්‍ය අරමුණක් කරගත් භාවනාව නම් කරන්න.

II සම්මා සති,සම්මා සමාධි අංග උපයෝගීවන භාවනාවේ නම ලියා, එම භාවනාව හඳුන්වන්න.

III අෂ්ඨ සමාපත්ති නම් කොට දක්වන්න.

IV භාවනාව මඟින් චිත්තේකාග්‍රතාව(සිතේ එකඟකම) ඇතිකර ගැනීම නිසා ශිෂ්‍යය ජීවිතයට ලැබෙන යහපත දක්වන්න.

## [[ 2012/2013 ]] 05 වන ප්‍රශ්නය

I සමථ භාවනාව සඳහා අරමුණු වශයෙන් යොදාගන්නා කර්මස්ථාන සංඛ්‍යාව දක්වන්න.

II එම කර්මස්ථාන ප්‍රභේද වශයෙන් ලියා දක්වන්න.

III මෙම භාවනාවෙන් ලද හැකි උසස් ප්‍රතිඵල දක්වා, එම උසස් ප්‍රතිඵල ලද සෘ ෂිවරුන් දෙදෙනෙකු නම් කරන්න.

IV විනය ගරුක සමාජයක් ගොඩ නැංවීම උදෙසා මානසික සංවරයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

## [[ 2011/2012 ]] 05 වන ප්‍රශ්නය

I ධ්‍යාන සමාපත්ති හා ප්‍රඥා සම්පත්ති ප්‍රතිලාභයට හේතුවන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

II එම භාවනා ක්‍රමවලින් ලෝකය පිළිබඳව යථාර්ථය දැකිය හැකි භාවනාව කවරේදැයි දක්වා, එය කෙටියෙන් හඳුන්වන්න.

III අරූපාවචර සමාපත්ති සතර නම් වශයෙන් ලියා, සම්බෝධි ඥාණය සඳහා බෝසතාණන් වහන්සේ විසින් වඩන ලද භාවනාවට අයත් නම ලියන්න.

IV පංච නීවරණ ධර්ම යටපත් කර ගැනීම මඟින් යහපත් මානසික නීරෝගීතාවක් සළසා ගත හැකි ආකාරය පහදන්න.

## [[ 2010/2011 ]] 05 වන ප්‍රශ්නය

I මානසික සංවරය ඇති කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ගය හඳුන්වන නම කුමක්දැයි දක්වන්න.
II එම ක්‍රියා මාර්ගය කෙටියෙන් පහදා එයට අයත් ප්‍රභේද නම් කරන්න.
III එකී ප්‍රභේදයන්ගෙන් නීවරණ ධර්ම යටපත් කරගත හැක්කේ කවර ප්‍රභේදයක් මඟින්දැයි පෙන්වාදී එම නීවරණ ධර්ම නම් වශයෙන් දක්වන්න.
IV මානසික සංවරය ඇතිකර නොගැනීමෙන් පුද්ගල හා සමාජගත ජීවිත පරිහානියට පත්වන අයුරු පැහැදිලි කරන්න.

## [[ 2009/2010 ]] 05 වන ප්‍රශ්නය

I කුසල් සිත් හී ඒකාග්‍රතාව හඳුන්වන නම කුමක්දැයි දක්වන්න.
II බාහිර හා ආධ්‍යාත්මික ලෝකය අරමුණු කරගෙන සිත දෙස බැලීම නම් වන භාවනාවේ නම ලියන්න.
III භය වැදෑරුම් චරිත නම් කර, අශ්වාස-ප්‍රශ්වාස දෙක මූලික කරගත් භාවනාවේ නම ලියන්න.
IV භාවනාව සඳහා යෝග්‍ය පරිසරයක් තෝරා ගැනීමේ වැදගත්කම පරීක්ෂා කර, සන්සුන් මනසක් පවත්වාගෙන යාමට භාවනාවෙන් ලද හැකි ප්‍රයෝජන පෙන්වා දෙන්න.

## [[ 2008/2009 ]] 05 වන ප්‍රශ්නය

I ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ එන සම්මා සති හා සම්මා සමාධි යන අංග උපයෝගී වන භාවනා නම් කරන්න.
II එකී භාවනාව හඳුන්වන සමානවාචී පද දෙක දක්වා, එම භාවනාව වැඩීමෙන් ලද හැකි ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.
III එම භාවනාවට අයත් කර්මස්ථාන සංඛ්‍යාව කොපමණ දැයි දක්වා, එය නම් වශයෙන් ලියන්න.
IV "බෞද්ධ ආර්‍ය මාර්ගයේ උසස්තම පියවර ප්‍රඥාව සාක්ෂාත් කර ගැනීමයි." මෙයට අදාළ භාවනාව ලියා එම ප්‍රඥාව සාක්ෂාත් කර ගන්නා අයුරු පෙන්වා දෙන්න.

## [[ 2007/2008 ]] 05 වන ප්‍රශ්නය

I කුසල් සිත්හී ඒකාග්‍රතාව හැඳින්වීම සඳහා යොදා ඇති නම දක්වන්න.
II එම නමින් හැඳින්වෙන භාවනාවේ නම ලියා, එම භාවනාව ප්‍රගුණ කර,විශිෂ්ඨත්වයට පත් ප්‍රකට ඍෂිවරු දෙදෙනෙකු නම් කරන්න.

III අරූපාවචර සමාපත්ති සතර නම් වශයෙන් දක්වා, ඒවා ඇතිකරගත් පුද්ගලයන් එහි විපාක වශයෙන් මරණයෙන් පසු උපදින ස්ථානත්, උපදින ස්වරූපයත් දක්වන්න.

IV අකුසල් සිතුවිලි මැඩ,කුසල් සිතුවිලි වැඩීමේ ක්‍රම මාර්ගය භාවනාව බව පෙන්වා දෙන්න.

## [[ 2006/2007 ]] 06 වන ප්‍රශ්නය

I භාවනා ප්‍රභේද දෙක නම් කරන්න.

II එම ප්‍රභේද හඳුන්වන්න.

III ආනාපානසති භාවනාව කමටහනක් වන්නේ කවර කාරණාවක් නිසා දැයි දක්වා, කර්මස්ථාන වර්ග වශයෙන් දක්වන්න.

IV එදිනෙදා ජීවිතයට භාවනාව වැදගත් වන අයුරු පෙන්වා දෙන්න.

## [[[[[ 2005 ]]]]] 06 වන ප්‍රශ්නය

I ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි සති හා සමාධි අංග දෙක උපයෝගී කරගත හැකි භාවනාව නම් කරන්න.

II එම භාවනාවට අයත් අරමුණු සංඛ්‍යාව දක්වා එය වැඩීමෙන් ලබා ගත හැකි උසස් ප්‍රතිඵල දෙකක් නම් කරන්න.

III සිත එකඟ කර ගැනීම සඳහා උපයෝගී කරගන්නා අරමුණු හඳුන්වන්නේ කවර නමකින්දැයි ලියා භාවනා කිරීම සඳහා යෝග්‍ය පරිසරයක වැදගත්කම පෙන්වා දෙන්න.

IV “ සියළු සත්වයෝ සුවපත් වෙත්වා” මේ සඳහා අදාළ කරගත හැකි භාවනාව නම් කර, එහි අනුහස් හතරක් දක්වා,සාමකාමී ලෝකයක් ඇතිකර ගැනීමට එම භාවනාව උපයෝගී කර ගත හැකි ආකාරය දක්වන්න.

## [[[[[ 2004 ]]]]] 06 වන ප්‍රශ්නය

I සමථ භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

II සමථ භාවනාව කවරේදැයි කෙටියෙන් හඳුන්වා, එයට අයත් කර්මස්ථාන සංඛ්‍යාව දක්වන්න.

III සතර බ්‍රහ්ම විහරණ නම් කර, සමථ භාවනාව වැඩීමෙන් ලබාගත හැකි ප්‍රතිඵල දෙකක් ලියන්න.

IV හාවනාව වැඩීමට සීල සංවරය අවශ්‍ය මන්දැයි දක්වා ආනාපානසතිය කමටහනක් වන්නේ කවර හේතුවක් නිසා දැයි පැහැදිලි කරන්න.

[[[[[ 2003 ]]]]] 06 වන ප්‍රශ්නය

I හාවනා යන පදයෙහි විග්‍රහය දක්වන්න.
II හාවනාවේ මූලික ප්‍රභේද දෙක දක්වා, ඒවා පිළිබඳව හැඳින්වීමක් කරන්න.
III විචිකිච්ඡාව නීවරණයක් වන අයුරු පහදා එහි අවශ්ථා දක්වන්න.
IV සාර්ථක ජීවිතයක් සඳහා හාවනාව උපයෝගී කරගත හැකි ආකාරය විස්තර කරන්න.

[[[[[ 2002 ]]]]] 05 වන ප්‍රශ්නය

I බෞද්ධ හාවනාවේ ප්‍රභේද නම් කරන්න.
II ඒවායින් එකක් විස්තර කරන්න.
III සමථ හාවනාවෙන් ලැබිය හැකි ප්‍රතිඵල කවරේද?
IV අෂ්ට සමාපත්ති නම් කරන්න.

[[[[[ 2001 ]]]]] 05 වන ප්‍රශ්නය

I සමථ හාවනාව හඳුන්වන්න.
II හාවනා වැඩීමට සීල සංවරය අවශ්‍ය වන්නේ මන්ද?
III කර්මස්ථාන වර්ග වශයෙන් දක්වන්න.
IV බ්‍රහ්ම විහාර විස්තර කරන්න.

[[[[[ 2000 ]]]]] 05 වන ප්‍රශ්නය

I සතර සතිපට්ඨානය නම් කරන්න.
II පළමු වැනි අනුපස්සනාවේ ප්‍රභේද දක්වන්න.
III "නව සීවථිකා"යන්න පැහැදිලි කරන්න.
IV "නව සීවථිකා" හාවනාවට යොමු කරන අයුරු පහදන්න.

[[[[[ 1999 ]]]]] 02 වන ප්‍රශ්නය

I සමථ භාවනාවට සාපේක්ෂකව ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි දැක්වෙන අංග දෙක නම් කරන්න.

II සමථ භාවනාව මඟින් යටපත් කොට දැමිය හැකි නීවරණ නම් කොට,එම නීවරණ මඟින් සිතට කෙරෙන බලපෑම ඉතා කෙටියෙන් දක්වන්න.

III සමථ භාවනාවෙන් ලැබිය හැකි උසස් ප්‍රතිඵල ගැන කෙටි සමාලෝචනයක් කරන්න.

IV විපස්සනා භාවනාව කුමක්දැයි හඳුන්වා,එම භාවනාව වැඩීමට සමථ භාවනාව උපකාරයක් වන්නේදැයි විමසන්න.

විල්වල ස්කෝලේ හාමුදුරුවෝ